# පුරප්පාඩු

## ගබඩා භාරකරු තනතුර
## (ස්ථිර / කොන්ත්‍රාත්)

**වසර 30 පුරා තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ගබඩා භාරකරු තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

| බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් |
|---|---|
| අධ්‍යන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී<br>I. ඉංග්‍රීසි<br>II. ගණිතය<br>යන විෂයන් ඇතුළුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) සමත්වීම.<br>හා<br>අධ්‍යන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) සමත්ව තිබීම<br><br>තොග පාලනය සම්බන්ධ මාස 06 කට නොඅඩු පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම, තොග පාලනය සම්බන්ධ වසර 01 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ. | බාහිර සුදුසුකම් හෝ සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ලිපිකාර හෝ තාක්ෂණික සේවා ශ්‍රේණියෙහි තනතුරක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>තොග පාලනය සම්බන්ධ මාස 06 කට නොඅඩු පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ. |

**වයස**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

| මාසික වැටුප් පරිමාණය | අනෙකුත් වරප්‍රසාද |
|---|---|
| සාමූහික ගිවිසුමට අනුව<br>රු. 30,440.00 3 x 925.00 - 33,215.00 | • වාර්ෂික ප්‍රසාද දීමනා<br>• ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්<br>• මාසික තේ කොළ දීමනාව<br>• සේවකයින් වෙත ලබා දෙන අනෙකුත් දීමනා සහ වරප්‍රසාද |

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලී අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

ගාල්ල, මාතර දිස්ත්‍රික්ක වල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (kalubowitiyanatea.lk වෙබ් අඩවියෙන් බාගත හැක) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2024.12.10 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**